## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
### 2013 මැයි / අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයනය - DVST - E 1015

ජන සංඛ්‍යාව හා සංවර්ධනය

<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රටක සංවර්ධනයෙහි විවිධ අංශ කෙරෙහි එරට සමාජයේ පුරාවිද්‍යාත්මක ගති ලක්ෂණ සෘජුව හෝ අනියම් වශයෙන් බලපාන ආකාරය පැහැදිලි කරන්න.

02. සංවර්ධනය වෙමින් පවතින රටවල ජනසංඛ්‍යාවේ ප්‍රමාණය සංවර්ධනයට දක්වන අහිතකර බලපෑම් විශ්ලේෂණය කරන්න.

03. අප්‍රිකානු රටවල සමාජ සංවර්ධනය කෙරෙහි ළමා ජනසංඛ්‍යාවේ වර්ධනය බලපාන අන්දම පරීක්ෂා කරන්න.

04. රටක ක්‍රියාකාරී ජනසංඛ්‍යාව (Active population) සැලසුම් කිරීමේ දී අනුගමනය කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග දීර්ඝකාලීන සංවර්ධනයට දක්වන දායකත්වය පැහැදිලි කරන්න.

05. පහත සඳහන් මාතෘකා <u>දෙකකට (02)</u> කෙටි සටහන් සපයන්න.

    i. වියපත් ජනසංඛ්‍යාවේ වර්ධනය හා සංවර්ධනය
    ii. ශ්‍රී ලංකාවේ සිට මැදපෙරදිග රටවලට සිදුවන සංක්‍රමණ හා සමාජ සංවර්ධනය
    iii. මත්‍යතා අනුපාතිකය හා සෞඛ්‍ය සංවර්ධනය
    iv. ජනසංඛ්‍යා ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රමඋපායන්

06. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය හා සංවර්ධන අසමතා අතර පවතින සබඳතාව උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

07. ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයේ කාලික වෙනස්කම් කටු සටහන් මගින් පැහැදිලි කර, එය ආර්ථික සංවර්ධනයට දක්වන බලපෑම විශ්ලේෂණය කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සැසඳීමේදී ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයේ ඉහළ මට්ටම සුවිශේෂ වීමට හේතුවූ සාධක විවේචනාත්මකව ඉදිරිපත් කරන්න.

****************************